**හලාවත ප්‍රාදේශීය සභාව - 2020**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

හලාවත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වසරේදී හා සමාලෝචිත වර්ෂයේදී මෝටර් ග්‍රේඩරය කුලියට දීමේ ආදායම් ලෙස ලැබුණු රු.230,744 ක් ආදායම් ලෙස හඳුනා නොගෙන මිශ්‍ර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර එයින් සමාලෝචිත වර්ෂයේ ආදායම වූ රු.226,300ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. එමෙන්ම 2021 වර්ෂය්දී තැන්පත් කරන ලද තැන්පතු 04ක එකතුව වූ රු.133,038ක් මිශ්‍ර තැන්පත් ගිණුමේ ශේෂයට එකතු කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මිශ්‍ර තැන්පතු ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | එලෙස රු.226,300ක්ද තැන්පත් ලේඛනයෙහි රඳවාගෙන ඇති බව පිළිගන්නා අතර 2021 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වර්ෂයට අදාල ආදායම් මග හැරීමකින් තොරව ගිණුම්වලට ගත යුතු අතර ගිණුම් වර්ෂයට අදාළ තැන්පතු පමණක් අවසාන ගිණුම් සකස් කිරීමේදී අදාළ තැන්පතු ගිණුම්වල දැක්විය යුතුවේ. |
| (ආ) | මුන්නේශ්වරම විශ්‍රාම ශාලාව ලෙස හඳුනාගත් වත්කමක් ඉඩම් ගොඩනැගිලි ලේඛනය සමග ඉදිරිපත් කර නොතිබූ නමුත් එවැන්නක් අළුත්වැඩියා සඳහා රු.7,357,394ක ගිවිසුමකට එළඹී තිබුණි. 2021 පෙබරවාරි 10 දිනවන විට රු.5,269,292ක මුදලක් ඒ සඳහා ගෙවා අවසන් කර තිබුණු අතර මෙම වැය ප්‍රාග්ධන ස්වභාවයේ වුවත් පුනරාවර්තන වැය ලෙස දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් නිමවූ පසු ජර්නල් සටහන් මඟින් නිවැරදිව ගිණුම්ගත කරන බව දන්වා සිටිමි. | පුනරාවර්තන සහ ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් නිසි පරිදි හඳුනාගන ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.258,175,088 ක් වු හිඟ හිටි ප්‍රාග්ධන ආධාර ශේෂය නිසි වර්ගීකරණයක් කර නොතිබුණු අතර එය ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු සහ ආදායම් ආධාර යන ශේෂවලින් සමන්විත විය. | නැවත එම උපලේඛනය විස්තරාත්මකව ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | ප්‍රාග්ධන ආධාර තුල ආදායම් ආධාර ඇතුළත් නොවන සේ නිසි වර්ගීකරණයකින් යුක්තව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයන් 05 කට අදාලව රු.319,507,736 ක් වූ වටිනාකම ඊට අනුරූපී වාර්තා අනුව රු.300,290,453ක් වූයෙන් ගිණුම් වටිනාකම් අතර රු.19,217,283 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන ශේෂය හා උපයෝගිතා ලේඛනය අනුව ශේෂ නොසැසඳෙන බව පිළිගන්නා අතර ඒ සම්බන්ධයෙන් සොයා 2021.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | වෙනස්කම් හඳුනාගෙන උපලේඛන හා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.132,589,464 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි හා උපලේඛන යාවත්කාලීනව ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,355,184ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.80,787,587 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් හා බදු**<br>වරිපනම් හා බදු ආරම්භක හිඟ හිටි ශේෂයෙන් සහ වර්ෂය වෙනුවෙන් බිල්කල වටිනාකමින් එකතුව රු.2,786,282 ක් හිඟ පැවතුණි. | 2021 වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | හිඟ මුදල්ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) **කුලී**<br>කඩකුලී ආරම්භක හිඟ හිටි ශේෂයෙන් සහ වර්ෂය වෙනුවෙන් බිල්කල වටිනාකමින් එකතුව රු.1,266,777 ක් හිඟ පැවතුණි. | 2021 වර්ෂය තුල අයකරගනු ලබනු බව දන්වා සිටිමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) **වෙනත් ආදායම්**<br>සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.120,442,542 ක් හිඟව පැවතුණි. | 2021 වර්ෂය තුල අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | හිඟ මුදල්ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 සැප්තැම්බර් 25 දින සිට 2013 සැප්තැම්බර් 24 දින දක්වා කාලසීමාව සඳහා මුන්නේශ්වරම විශ්‍රාම ශාලාව සඳහා බදුකුලී ගෙවීම බදුකරු විසින් පැහැර හැර තිබුණු අතර තව දුරටත් රු.181,347ක කුලී මුදලක් සභාවට අයවීමට තිබුණි. අදාළ බදුකරු සමග සභාව විසින් එළඹ තිබූ බදු ගිවිසුමෙහි වලංගුභාවයක් නොමැතිවීම මත බදුකරුට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා දැනුවත් කළ අතර අදාල රු.181,347ක මුදල අයකර නොගැනීම සම්බන්ධයෙන් මේ වන විට මූලික විමර්ශනයක් පළාත් පාලන දේපාර්තමේන්තුව මගින් ආරම්භ කර ඇති අතර එහි දී එවකට රාජකාරි කටයුතු සිදු කල නිලධාරිනියට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ කර ඇතිබව දන්වා සිටිමි. | සභාව විසින් එළඹෙන ගිවිසුම් නිසි වලංගුභාවයකින් හා නීති මගින් කටයුතු කළ හැකි ඒවා විය යුතුවේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාව විසින් භුක්ති විඳිනු ලබන පවරා නොගත් ඉඩම් 16න් එක් ඉඩමක පවරා ගැනීමේ කටයුතු 2021 වර්ෂයේදී අවසන් කොට ඇති අතර ඉඩම් 02ක් ප්‍රාදේශිය ලේකම්ගේ අයිතියට යටත්ව සංවර්ධන කටයුතු සඳහා පමණක් ලබා දෙන බව දන්වා ඇතත් අනෙක් ඉඩම් 13 සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | මෙම ඉඩම් 13 හලාවත ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව දන්වමි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර ගැනීම පිළිබඳව පසු විපරම් සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. |